Lesson 16 **ඔයා චිත්‍රපටි බලනවද ?**

Do you watch movies ?

සාමාන්‍ය ක්‍රියා වල ප්‍රශ්නාර්ථය

සාමාන්‍ය ක්‍රියාවල ප්‍රශ්නාර්ථය, ඒ කියන්නේ ඒ අදාළ ක්‍රියාව කරනවද කියල අහන විදිය තමයි අපි මෙහිදී ඉගෙන ගන්නේ.සාමාන්‍යයෙන් ඉංග්‍රීසි භාෂාවේ වාක්‍යයක් ප්‍රශ්නයක් බවට පෙරලෙන්නේ කුමන හෝ පදයක් වාක්‍යයේ ඉදිරියට පැමිණීමෙන් . Am ,is ,are , පාඩමේදී වගේම Can , Have පාඩම් වලදිත් ඔබ එය දකින්න ඇති . මෙහිදීත් සිදු වන්නේ එයයි . මෙහිදී වාක්‍යය ඉදිරියට එන්නේ Do , Does කියන පද දෙක .

- වාක්‍යයේ ක්‍රියාව කරන කෙනා ඒක වචන නම් ඉදිරියට එන්නේ Does . එවිට ක්‍රියා පදය අගට යෙදුනු s අකුර මෙහිදී ඉවත් වෙනවා

අපි බලමු පසුගිය පාඩමේ උදාහරණ වලට ගත් වාක්‍යය කීපයක්ම ගෙන ඒවා ප්‍රශ්න වලට හරවලා

Shanika write<u>s</u> poems

ශානිකා රයිට්ස් පොයම්ස්

ශානිකා කවි ලියනවා

↓

Does Shanika write poems ? (මෙහිදී අර ක්‍රියාපදය අගට එකතුවී තිබූ s අකුර ඉවත් වෙනවා )

ඩස් ශානිකා රයිට් පොයම්ස් ?

ශානිකා කවි ලියනවද ?

She sing<u>s</u> well

ෂි සිංග්ස් වෙල්

ඇය හොදින් ගායනා කරනවා

↓

Does she sing well ?

ඩස් ෂි සිංග් වෙල් ?

ඇය හොදින් ගායනා කරනවද ?

She speaks English fluently
ෂි ස්පීක්ස් ඉංග්ලිෂ් ෆ්ලුවන්ට්ලි
ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතාකරනවා ?
↓
Does she speak English fluently ?
ඩස් ෂි ස්පීක් ඉංග්ලිෂ් ෆ්ලුවන්ට්ලි ?
ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරනවද ?

දැන් ඔබට පැහැදිලියි කොහොමද වාක්‍යයේ ඒ වෙනස වෙන්නේ කියලා.
අපි කෙලින්ම තවත් උදාහරණ වාක්‍යය වලට යමු

Does your mother know about this ?
ඩස් යුව(ර්) මද(ර්) නෝ අබවුට් දිස් ?
ඔයාගේ අම්මා මේ ගැන දන්නවද ?

Does Sachini talk with you ?
ඩස් සචිනි ටෝක් විත් යූ ?
සචිනි ඔයා එක්ක කතා කරනවද ?

Does Ashen do a job ?
ඩස් අශේන් ඩූ අ ජොබ් ?
අශේන් ජොබ් එකක් කරනවද ?

Does she work all day ?
ඩස් ෂී ව(ර්)ක් ඕල් ඩේ ?
ඇය දවසෙම වැඩ කරනවද ?

Does he call you ?
ඩස් හී කෝල් යූ ?
ඔහු ඔයාට කෝල් කරනවද ?

Does it work now ?

ඩස් ඉට් ව(ර්)ක් නව් ?

දැන් ඒක වැඩ කරනවද ?

Does it work properly ?

ඩස් ඉට් ව(ර්)ක් ප්‍රොප(ර්)ලි ?

ඒක හරියට වැඩ කරනවද ?

මීලගට බලමු බහු වචන කතෘ කෙනෙක් සමග මේ ප්‍රශ්නය සැදෙන්නේ කොහොමද කියලා

- සාමාන්‍ය ක්‍රියාව කරන කෙනා බහු වචනයක් නම් වාක්‍යයේ ඉදිරියට එන්නේ Do කියන පදය
  (මෙහිදී බහු වචන කතෘ වාක්‍යය නිසා ක්‍රියා පදය අගට s අකුරක් කොහොමවත් යෙදෙන්නේ නැහැ )

පෙර පාඩමේදී උදාහරණ වලට ගත් වාක්‍ය කීපයක්ම ගෙන ඒවා ප්‍රශ්නාර්ථ වලට හරවා බලමු

Sri Lankans like Cricket very much

ශ්‍රී ලංකන්ස් ලයික් ක්‍රිකට් වෙරි මච්

ලාංකිකයෝ ක්‍රිකට් වලට ගොඩක් කැමතියි

↓

Do Sri Lankans like Cricket very much ?

ඩූ ශ්‍රී ලංකන්ස් ලයික් ක්‍රිකට් වෙරි මච් ?

ලාංකිකයෝ ක්‍රිකට් වලට ගොඩක් කැමතිද ?

You do it well

යූ ඩූ ඉට් වෙල්

ඔයා ඒක හොදට කරනවා

↓

Do you do it well ?

ඩූ යූ ඩූ ඉට් වෙල් ?

ඔයා ඒක හොදට කරනවද ?

They help him

දේ හෙල්ප් හිම්

ඔවුන් ඔහුට උදව් කරනවා

↓

Do they help him ?

ඩූ දේ හෙල්ප් හිම් ?

ඔවුන් ඔහුට උදව් කරනවද ?

අපේ එදිනෙදා සාමාන්‍ය ජීවිතයේදී එක එක්කෙනා අපෙන් මෙන්න මේ වගේ ප්‍රශ්න ගොඩාක් අහනවා.

ඔයා කතන්දර පොත් කියවනවද ?
ඔයා සංගීතයට කැමතිද ?
ඔයා පියුම්ව දන්නවද ?
ඔයා ෆිල්ම්ස් බලනවද ?
ඔයා ඉංග්‍රීසි පන්තියකට යනවද ?
ඔයා IPL මැච් බලනවද ?
ඔයා වේලාසනින් නැගිටිනවද ?
ඔයා මස් කනවද ?
ඔයා tv එකේ ප්‍රවුත්ති බලනවද ?
ඔයා හැමදාම ගෙදර වැඩ කරනවද ?
ඔයා ගෙදර වැඩට අම්මට උදව් කරනවද ?

මේවා ඔක්කොම සාමාන්‍ය ක්‍රියා වල ප්‍රශ්නාර්ථ. අපිට නිතර ප්‍රයෝජනවත් වන නිසා මේ වගේ ප්‍රශ්න ඉංග්‍රීසියෙන් අහන විදිය කොහොමද කියලා බලමු

Do you read story books ?

ඩූ යූ රීඩ් ස්ටෝරි බුක්ස් ?

ඔයා කතන්දර පොත් කියවනවද ?

Do you like music ?

ඩූ යූ ලයික් මියුසික් ?

ඔයා සංගීතයට කැමතිද ?

Do you know Piyumi ?
ඩූ යූ නෝ පියුමි ?
ඔයා පියුමිව දන්නවද ?

Do you watch movies ?
ඩූ යූ වොච් මූවීස් ?
ඔයා චිත්‍රපටි බලනවද ?

Do you attend an English class ?
ඩූ යූ අටෙන්ඩ් ඇන් ඉංග්ලිෂ් ක්ලාස් ?
ඔයා ඉංග්‍රීසි පන්තියකට යනවද ?

Do you watch IPL matches ?
ඩූ යූ වොච් අයි පී එල් මැචස් ?
ඔයා IPL මැච් බලනවද ?

Do you get up early ?
ඩූ යූ ගෙටප් අ(ර්)ලි ?
ඔයා වේලාසනින් නැගිටිනවද ?

Do you eat meat ?
ඩූ යූ ඊට් මීට් ?
ඔයා මස් කනවද ?

Do you watch the news on TV ?
ඩූ යූ වොච් නිව්ස් ඔන් ටී වී ?
ඔයා tv එකේ ප්‍රවෘත්ති බලනවද ?

Do you do your homework everyday ?
ඩූ යූ ඩූ යුව(ර්) හෝම්ව(ර්)ක් එව්රිඩේ ?
ඔයා හැමදාම ගෙදර වැඩ කරනවද ?

Do you help your mother with house work ?
ඩූ  යූ  හෙල්ප් යුව(ර්) මද(ර්) විත් හවුස් ව(ර්)ක්  ?
ඔයා ගෙදර වැඩට අම්මට උදව් කරනවද ?

අපි තවත් උදාහරණ කීපයක් අරගෙන බලමු

Do they work hard ?
ඩූ දේ ව(ර්)ක්  හාඩ් ?
ඔවුන් මහන්සියෙන් වැඩ කරනවද ?

Do your friends know the way here ?
ඩූ  යුව(ර්) ෆ්‍රෙන්ඩ්ස් නෝ ද වේ හියර්) ?
ඔයාගේ යාලුවෝ දන්නවද මෙහෙ එන පාර ?

Do we eat now ?
ඩූ  වී  ඊට්  නව් ?
අපි දැන් කනවද ?

Do they disturb you ?
ඩූ  දේ ඩිස්ට(ර්)බ් යූ  ?
ඔවුන් ඔබට බාධා කරනවද ?

Do they make noise ?
ඩූ  දේ මේක්  නොයිස් ?
ඔවුන් සද්ද කරනවද ?

Do children like this food ?
ඩූ  චිල්ඩ්‍රන් ලයික් දිස් ෆුඩ් ?
ළමයි කැමතිද මේ කෑමට ?

Do Sri Lankans like Indian music ?
ඩූ  ශ්‍රී ලන්කන්ස් ලයික් ඉන්දියන් මියුසික් ?
ලාංකිකයන් ඉන්දියන් සංගීතයට කැමතිද ?

Do your parents know about this ?

ඩූ යුව(ර්) පේරන්ට්ස් නෝ අබවුට් දිස් ?

ඔයාගේ දෙමව්පියන් මේ ගැන දන්නවද ?

ඒ අනුව දැන් ඔබට පැහැදිලියි මේ වාක්‍ය රටාව හැදෙන්නේ කොහොමද කියල . කතෘ ඒක වචන නම් වාක්‍ය යේ මුලට එන්නේ does. කතෘ බහු වචන නම වාක්‍යයේ මුලට එන්නේ do

Ex 10 - part 1 පහත වාක්‍යය මාරු කර දී තිබෙන වචන යොදාගෙන ඔබ විසින් ගොඩ නැගිය යුතුයි. කතෘ ඒක වචන නම් ක්‍රියා පදය අගට s අකුරක් යෙදිය යුතුයි. මෙහි දෙවැනි කොටසේදී ඒ වාක්‍යය සියල්ල නැතාර්තයට් හැරවිය යුතුයි. තුන් වැනි කොටසේදී ඒ වාක්‍යය ප්‍රශ්නාර්ථයට හැරවිය යුතුයි . ඒ වගේම මේක මතක තියා ගන්න . වාක්‍යයක මුල අකුර නිතම කැපිටල් අකුරකින් පටන් ගත යුතුයි

1. ඔවුන් හැන්දෑවට ක්‍රිකට් සෙල්ලම් කරනවා
   cricket , play , in the evening , they
2. ඔහු හැමදාම පත්තරේ කියවනවා
   the newspaper , everyday. he , read
3. ඔවුන් අනුන්ට උදව් කරනවා
   others , help , they
4. ඔහු හැමදාම ඉස්කෝලේ එනවා
   come , every day, to school , he
5. ඔවුන් තැන දන්නවා
   the place , they ,know
6. ඔහු විභාගය වෙනුවෙන් වෙහෙසී වැඩ කරනවා
   for the exam , he , work hard
7. ඇය දැන් ලන්ඩනයේ ජීවත් වෙනවා
   in London , now , she ,live
8. ඔහුගේ සහෝදරයා පොත් ලියනවා
   his brother,books , writes

9. ඔවුන් ජීවත් වෙන්නේ ලොකු ගෙදරක
   live, in a big house,they

10. මම හැමදාම මගදී ඇයව  දකිනවා
   see , on  the way , her , I , everyday

Ex  part 2 - ඉහත වාක්‍යය දහය නැගර්තයට හරවන්න
Ex  part 3 - ඉහත වාක්‍යය දහය ප්‍රශ්නාර්ථයට හරවන්න

Lesson  16 **Spoken English**

ඉංග්‍රීසි භාෂාවේදී ස්තුතිය පල කලාම එයට ප්‍රතිචාරයක් දක්වනවා වගේම , සමාව ඉල්ලුවමත් එයට ප්‍රතිචාරයක් දක්වනවා. මෙය ඔවුන්ගේ සංස්කෘතියේ තියෙන වැදගත් ලක්ෂණයක්. අපි බලමු කොහොමද සමාව ඉල්ලීමකට ප්‍රතිචාර දක්වන්නේ කියලා. මේ තියෙන්නේ ඒ වගේ සමාවකට ප්‍රතිචාර දක්වන විධි කිහිපයක්

It’s okay - ඉට්ස් ඕකේ - ඒක  කමක් නැහැ

No problem ! - නෝ  ප්‍රොබ්ලම් - ප්‍රශ්නයක් නැහැ

Don’t worry about it - ඩෝන්ට් වොරි අබවුට් ඉට් - ඒ ගැන කණගාටු වෙන්න එපා

That’s all right - දැට්ස් ඕල් රයිට් - ඒක  කමක් නැහැ

It’s fine - ඉට්ස් ෆයින් - ඒක  කමක් නැහැ

Never  mind - නෙව(ර්) මයින්ඩ් - ගානක් නෑ /කමක් නෑ

කෙටි උදාහරණ සංවාද කිහිපයක් ගෙන බලමු

Dialogue 1

A : I’m sorry, I stepped on your foot
අයැම් සොරි, අයි ස්ටෙප්ඩ් ඔන්  යුව(ර්) ෆුට්
මට සමාවෙන්න , මම ඔයාගේ කකුල පෑගුවා

B : It’s okay, it didn’t hurt.

ඉට්ස් ඕකේ . ඉට් ඩිඩ්න්ට් හ(ර්)ට්

ඒක කමක් නැහැ. ඒක රිදුනේ නැහැ

Dialogue 2

A : I am sorry, I dropped your pencil.

අයෑම් සොරි , අයි ඩ්‍රොප්ඩ් යුව(ර්) පෙන්සිල්

මට සමාවෙන්න , මම ඔයාගේ පැන්සල වැට්ටුවා

B : No problem, I have another one.

නෝ ප්‍රොබ්ලම් , අයි හෑව් අනද(ර්) වන්

ප්‍රශ්නයක් නෑ , මට තව එකක් තියෙනවා

Dialogue 3

A: I’m very sorry, I forgot to bring your book back.

අයෑම් වෙරි සොරි, අයි ෆොගොට් ටු බ්‍රිං යුව(ර්) බුක් බැක්

මම ගොඩක් සමාවෙන්න , මට ඔයාගේ පොත ආපහු ගේන්න බැරි වුනා

B: That’s all right, just bring it tomorrow.

දැට්ස් ඕල් රයිට් , ජස්ට් බ්‍රින් ඉට් ටුමෝරෝ

ඒක කමක් නැහැ , හෙට ගේන්නකෝ

Dialogue 4

A : I’m really sorry for breaking your toy

අයෑම් රියලි සොරි ෆෝ බ්‍රේකින් යුව(ර්) ටෝයි

මට ඇත්තටම සමාවෙන්න ඔයාගේ සෙල්ලම් බඩුව කැඩුවට

B : It’s okay. We can fix it.

ඉට්ස් ඕකේ .වී කැන් ෆික්ස් ඉට්

ඒක කමක් නැහැ . අපිට ඒක හදා ගන්න පුළුවන්

Dialogue 5

A: I am really sorry for my mistake

අයෑම් සොරි ෆෝ මයි මිස්ටේක්

මට ඇත්තටම් කනගාටුයි මගෙන් වෙච්චි අත් වැරැද්දට

B: That’s all right. It happens.

දැට්ස් ඕල් රයිට් . ඉට් හැපන්ස්

ඒක කමක් නැහැ .එහෙම වෙනවා

Dialogue 6

A: I am extremely sorry . It was a mistake

අයෑම් එක්ස්ට්‍රීම්ලි සොරි. ඉට් වෝස් අ මිස්ටේක්

මට අතිශයින්ම කනගාටුයි/ මම බෙහෙවින්ම සමාව ඉල්ලනවා . ඒක අත් වැරද්දක්

B: Don’t worry about it

ඩෝන්ට් වොරි අබවුට් දැට්

ඒ ගැන කනගාටු වෙන්න එපා

Dialogue 7

A: I am really sorry for what happened

අයැම් රියලි සොරි ෆෝ වට් හැපන්ඩ්

මට ඇත්තටම කනගාටුයි වෙච්චි දේට / මට ඇත්තටම සමා වෙන්න වෙච්චි දේට

B: That’s okay, Forget about it

දැට්ස් ඕකේ . ෆොගෙට් අබවුට් ඉට්

ඒක කමක් නැහැ . ඒක අමතක කරන්න

Dialogue 8

A: Sorry, I was late.

සොරි, අයි වෝස් ලේට්

සමාවෙන්න, මම පරක්කු වුනා

B: It’s all right. Try to be punctual next time

ඉට්ස් ඕල් රයිට් . ට්‍රයි ටු බී පංක්චුවල් නෙක්ස්ට් ටයිම්

ඒකට කමක් නැහැ . ඊලඟ පාර වෙලාවට වැඩ කරන්න උත්සාහ කරන්න

Dialogue 9

A: Sorry, I forgot it

සොරි , අයි ෆොගොට් ඉට්

සමාවෙන්න, මට ඒක අමතක වුනා

B: No problem. I'll get another one.

නෝ ප්‍රොබ්ලම් . අයිල් ගෙට් අනද(ර්) වන්

ප්‍රශ්නයක් නෑ , මම වෙන එකක් ගන්නම්

Dialogue 10

A : I'm sorry for losing your eraser.

අයෑම් සොරි ෆෝ ලූසිං යුව(ර්) ඉරේස(ර්)

ඔයාගේ මකනේ නැති කලාට මට සමාවෙන්න

B : Don't worry . I have another

ඩෝන්ට් වොරි , අයි හැව් අනද(ර්)

කනගාටු වෙන්න එපා , මට වෙන එකක් තියෙනවා

Dialogue 11

A: Sorry for taking your seat.

සොරි ෆෝ ටේකිං යුව(ර්) සීට්

ඔයාගේ සීට් එක ගත්තට මට සමාවෙන්න

B: That’s okay, I’ll sit somewhere else.

දැට්ස් ඕකේ , අයිල් සිට් සම්වෙයා එල්ස්

කමක් නැහැ , මම වෙන තැනක ඉඳ ගන්නම්

Dialogue 12

A : Sorry for taking too much time

සොරි ෆෝ ටේකිං ටූ මච් ටයිම්

ගොඩාක් වෙලාව ගත්තට සමාවෙන්න

B : Never mind ! We have enough time

නෙව(ර්) මයින්ඩ් ! වී හැව් ඉනෆ් ටයිම්

කමක් නැහැ . අපිට වෙලාව තියෙනවා

Dialogue 13

A: Sorry for spilling water here

සොරි ෆෝ ස්පිලිං වෝට(ර්) හිය(ර්)

මෙතැන් වතුර ඉහිරුවට මට සමාවෙන්න

B : Don’t worry . Let’s clean it up.

ඩෝන්ට් වොරි . ලෙට්ස් ක්ලීන් ඉට් අප්

කණගාටු වෙන්න එපා . අපි ඒක සුද්ද කරමු

Dialogue 14

A : I am sorry for hurting your feelings

අයැම් සොරි ෆෝ හ(ර්)ටිං යුව(ර්) ෆීලින්ස්

ඔයාගේ හිත රිද්දුවට මට සමාවෙන්න

B : That's all right. Forget it

දැට්ස් ඕල් රයිට් . ෆොගෙට් ඉට්

ඒක කමක් නැහැ , ඒක අමතක කරන්න

**Vocabulary 16**

Properly – ප්‍රොප(ර්)ලි – හරියට , නිසියාකාරව

Movie – මූවී – චිත්‍රපටය

News – නිව්ස් – පුවත්

Homework – හෝම්ව(ර්)ක් – ගෙදරවැඩ (පාසලේ හෝ ඉගෙනීම් කාර්යයකට අයත් )

House work – හවුස් ව(ර්)ක් – ගෙදර වැඩ ( ගෙදර දොරේ එදිනෙදා වැඩ )

Work hard – ව(ර්)ක් හාඩ් – මහන්සිවෙන් වැඩ කරනවා

Disturb – ඩිස්ට(ර්)බ් – බාධා කරනවා

Furniture – ෆ(ර්)නිච(ර්) – ගෘහභාණ්ඩ

Spider – ස්පයිඩ(ර්) – මකුළුවා

Ceremony – සෙරමනි – උත්සවය

Tail – ටේල් – වලිගය

Garbage – ගාබේජ් – කුණුකසල

Coward – කව(ර්)ඩ් – බයගුල්ලා

Rain – රේන් – වැස්ස

Drizzle – ඩ්‍රිස්ල් – පොදවැස්ස

Famous – ෆේමස් – ප්‍රසිද්ධ

Dress – ඩ්‍රෙස් – ඇඳුම

Cloth – ක්ලොත් – රෙදි කෑල්ල

Clothes – ක්ලෝද්ස් – ඇඳුම්

Cobweb – කොබ්වෙබ් – මකුළු දැල

Dust – ඩස්ට් – දූවිල්ල

Wood – වුඩ් – දැව

Wooden – වුඩන් – දැවමය

arm – ආම් – අත

elbow – එල්බෝ – බාහු මුල

wrist – රිස්ට් – මැණික් කටුව

wrist watch - රිස්ට් වොච් - අතේ බඳින ඔරලෝසුව

hand – හැන්ඩ් – අත

finger – ෆින්ග(ර්) – ඇඟිල්ල

thumb – තම් – මහපට ඇඟිල්ල